**ශීර්ෂය 437- ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 14 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ ඇති කරන ලද නව අමාත්‍යාංශයක් බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව සැසඳීම සඳහා ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

-------------------------------------------------

2020 ජනවාරි 01 දින සිට 2020 මාර්තු 05 දක්වා හා 2020 සැප්තැම්බර් 01 දින සිට 2020 ඔක්තෝබර් 20 දින දක්වා කාලපරිච්ඡේද වෙනුවෙන් පිලිවෙලින් 2019 ඔක්තෝබර් 28 දින හා අගෝස්තු 28 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කළ අතුරු සම්මත ගිණුම් දෙක මඟින්ද, 2020 මාර්තු 06 දින සිට 2020 මැයි 31 දින දක්වා හා 2020 ජුනි 01 දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා කාලපරිච්ඡේද වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(3) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනධිපතිතුමා විසින් නිකුත් කරන ලද අධිකාර බලපත්‍ර මඟින්ද, 2020 වර්ෂයේ රජයේ වියදම් සිදුකර තිබුණි. 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයේ ව්‍යුහයේ වෙනස්වීම් සිදු වී තිබුණත්, 2020 අගෝස්තු 31 දින දක්වා රජයේ වියදම් 2019 වර්ෂයේ සම්මත කළ අතුරු සම්මත ගිණුමේ සඳහන් වැය ශීර්ෂ අනුව සිදු කර තිබුණි. අතිගරු ජනාධිපතිතුමා විසින් 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශවලට අනුරූපී වන පරිදි 2020 ඔක්තෝබර් 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කළ 2020 අංක 6 දරන විසර්ජන පනතේ 10 හා 12 වගන්තිවල සඳහන් විධිවිධානවලට අනුව 2020 ජනවාරි මාසයේ සිට අගෝස්තු 31 දක්වා වියදම් 2020 අංක 6 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ සඳහන් වැය ශීර්ෂ යටතේ වන වැය විෂයයන්වලට අන්තර්ග්‍රහනය කළ යුතුව තිබුණි. එම කාර්යභාරය 2020 නොවැම්බර් 30 දිනැති අංක 6/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව සිදු කිරීමට භාණ්ඩාගාරය විසින් උපදෙස් ලබා දී තිබුණි.

2020 අගෝස්තු 08 දින අතිගරු ජනාධිපතිතුමා විසින් අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසු ශීර්ෂ 437 - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ආරම්භ විය. ඉහත සඳහන් උපදෙස් පරිදි 2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවති අමාත්‍යාංශ දෙකක වැය විෂයයන් 27 ක් යටතේ වැය කර තිබුණු එකතුව රු. මිලියන 106.6 ක වියදම මෙම අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු. 430,720,831ක් වී තිබුණි. එයින් 2021 අප්‍රේල් 30 දින දක්වාම අයකර නොගත් ආදායම රු.180,888,093 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 3ක් සඳහා 2020 වර්ෂයට අදාලව වෙන්කරන ලද රු.1,982,000 ක්වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.1,977,587ක් එනම් සියයට 99 ක් ඉතිරිව පැවතුණි. තවද, ප්‍රාග්ධන වැය විෂයයන් 2ක් වෙනුවෙන් 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද රු.658,000 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.650,000 ක් ඉතිරිව පැවති අතර එය වැය විෂයයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 98ක් වී තිබුණි. | ප්‍රතිපාදන ඉතිරිවීමට කොවිඩ් වසංගත තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | ප්‍රතිපාදනයන් නියමිත පරිදි උපයෝජනය තුලින් අපේක්ෂිත අරමුණු ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වැය විෂය අංක 2103 සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනය වූ රු. 250,000 ක මුදල ප්‍රමාණවත් නොවීම මත රු. 580,000 ක් මු.රෙ. 66 මාරු කිරීම් මගින් ලබාගෙන තිබුණ නමුත් මාරු කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදනය නියමිත කාලසීමාවේදී සම්පූර්ණ කළ නොහැකි වීමෙන් ප්‍රතිපාදනය ඉතිරි විය. | අත්‍යවශ්‍ය වන ප්‍රතිපාදන පමණක් මාරු කිරීමට හා මාරු කරගත් ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත | අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කළ පසුව අදාල වාර්තා එවීමට කටයුතු කළ හැකි වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා එලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු ලබාගෙන අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීමට උත්සාහ දරමින් සිටී. | -එම- |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 103 (1) (ආ) | වාහන අනතුරු සිදු වූ වහාම ඒ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කළයුතු වුවද, අංක PG 9518 දරණ වාහනයේ අනතුර පිළිබඳව අදාල නිලධාරීන් වෙත වාර්තා කර තිබුණේ අනතුර සිදු වී දින 09 ක් ගත වීමෙන් පසුව විය. | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නව සේවකයෙකු බැවින් අනතුර සම්බන්ධව කඩිනමින් කාර්යාලයට (එදිනට) දැනුම් දී නොමැත. එහෙත් ඉදිරියේදී එසේ නොවන ලෙස වග බලාගැනීමට ඔවුන් දැනුවත් කරන ලදී. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| | (ii) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතු වීම. |
| | (iii) මුදල් රෙගුලාසි 115 (3) (අ) හා (ආ) | අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 23 දින කැබ් රථයකට අදාලව සිදුකරන ලද අලුත්වැඩියාවක් වෙනුවෙන් එනම්, අමාත්‍යාංශයට අදාළ නොවන කාලසීමාවක ගනුදෙනුවක් සඳහා 2021 ජනවාරි 29 දින මුදල් රෙගුලාසි වලට පටහැනිව ගෙවීම් කර තිබුණි. | අදාල ගෙවීම් ප්‍රමාදය අමාත්‍යාංශයේ වගකීමක් නොවූ අතර සංචාරක අමාත්‍යාංශයේ දැනුම් දීම මත මෙම ගෙවීම අවශ්‍යතාවය සලකා සිදු කරන ලදී. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 214 | බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට සියලුම බැරකම්, බැරකම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව සියලුම බැරකම් හඳුනා ගෙන නියමිත පරිදි බැරකම් ලේඛනයක ඇතුලත් කර එය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම. |
| (ආ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 (අ), (ආ) හා (ඇ) ඡේද හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | අමාත්‍යාංශය විසින් අවම වශයෙන් වර්ෂ 03 ක කාලසීමාවක් සඳහා ප්‍රසම්පාදන සැලසුමක් හා එළඹෙන වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙළ කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අදාල සැලැස්ම පිළියෙළ කර ඇත. | අවම වර්ෂ 03 ක කාලසීමාවක් සඳහා ප්‍රසම්පාදන සැලසුමක් හා එළඹෙන වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙළ කළ යුතු වීම. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සංචාරක අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු වත්කම් 31ක පිරිවැය හෝ තක්සේරු අගය ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් භාවිතා කරන සියලු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 දී මෙම වත්කම් ගිණුම් ගත කර අදාල වාර්තාව පිළියෙළ කර ඉදිරිපත් කරනු ඇත. | මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වන අතර එම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වාහන 11 ක් පැවති නමුත් එම වාහන 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(ii) ඡේදය ප්‍රකාරව විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතපසු වූ රාජකාරී ඉදිරියේදී ක්‍රමානුකූලව යථාවත් කරනු ලබන අතර වාහන පවරා ගැනීම ද ඒ අනුව සිදු කිරීමට අපේක්ෂිතය. | වාහන විධිමත්ව පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |

**3.2** **පාඩු හා හානි**

-------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන - (i) ) අංක PG 9548 දරන කැබ් රථයෙහි 2020 සැප්තැම්බර් 16 දින සිදු වූ අනතුර පිළිබඳ සිදුවීම වාර්තා කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මත ප්‍රාරම්භක වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කර ඇතත් පූර්ණ වාර්තාව අලුත්වැඩියාව අවසන් වූ වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර අලාභ තක්සේරුව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍යාංශය විසින් මෙම අනතුර මඟින් සිදු වූ අලාභය ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 ඔක්තෝබර් 06 දිනැති 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ 12(1) වගන්තිය අනුව සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන එම අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාලව තිරසර සංවර්ධන උපායමාර්ග සකස් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන උපායමාර්ග ඉලක්ක සකස් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශයට අයත් ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කර හඳුනාගත් අපනයන කලාප වලට විශේෂිත වූ තිරසර සංවර්ධන උපාය මාර්ග හඳුනා ගනිමින් පවතී. | අමාත්‍යාංශය විසින් තිරසාර සංවර්ධන උපායමාර්ගික ඉලක්ක සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**5.** **යහපාලනය**

-----------

**5.1** **අභ්‍යන්තර විගණනය**

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) ඡේදය අනුව අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් එම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වැඩ බැලීමේ පදනම මත හෝ අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. | අභ්‍යන්තර විගණන කටයුතු විධිමත්ව සිදු කිරීමට අභ්‍යන්තර විගණකවරයෙකු කඩිනමින් පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු මස 09 වන දිනැති අංක 2187/27 දරන අමාත්‍ය මණ්ඩලය වෙත විෂයපථය පැවරීමේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 25.1(01) වගන්තිය අනුව රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම සිදු කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහභාගී කරගෙන නොතිබුණි. | 2021 , 2 වන කාර්තුවේ සිට අමාත්‍යාංශය යටතේ පවතින ආයතන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී කරවීමට කටයුතු කරනු ඇත. | අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහභාගී කරගෙන එම ආයතනවල කාර්යභාරය පසු විපරම් කිරීම හා ඇගයීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වීම. |

**6. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී පුරප්පාඩු 22 ක් පැවති අතර අමාත්‍යාංශ ලේකම් යටතේ වන ප්‍රධාන තනතුරු තුනක් 2021 මාර්තු 19 වන විගණිත දිනය වන විටත් පුරප්පාඩුව පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවස්ථා කීපයකදී උත්සාහයන් දරා ඇත. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පුරප්පාඩු වූ තනතුරුවලට කාලානුරූපීව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (02) II ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර නිලධාරී තනතුරු 03 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණද එම සේවා කොන්ත්‍රාත් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සේවා අවශ්‍යතා මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර වාචික එකඟතාවය මත විශ්‍රාමික I වන ශ්‍රේණියේ කළමනාකරණ සේවා නිලධාරීන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් සේවයට කැඳවූ අතර ඊට අදාල අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. | අවශ්‍ය බඳවා ගැනීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට එකඟව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |